සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**

මගේ අංකය / **எனது இல** DSD/HO/IT/11/e bank ............ ඔබේ අංකය / **உமது இல** / Your No ............ දිනය / **திகதி** / Date 2024.01.29

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරු,

<u>**සමෘද්ධි බැංකු වල මැනුවල් ක්‍රියාවලිය අත්හැරීම**</u>

දිවයින පුරා විහිදී ඇති සමෘද්ධි බැංකු 1092 න් 1083ක් පරිගණක මෘදුකාංගය ස්ථාපිත කර සියලු මැනුවල් කාර්යයන් මෘදුකාංගය මගින් සිදු කරන මට්ටමට පැමිණ ඇත. මෙම තත්වය මත බැංකු වල මැනුවල් ක්‍රියාකාරිත්වය අත්හැර පරිගණක මෘදුකාංගය තුලින් පමණක් බැංකු ක්‍රියාවලිය සිදු කිරීම ආරම්භ කර ඇත. මේ වන විට බැංකු 100ක් සඳහා මැනුවල් ක්‍රියාවලිය අවසන් කිරීමට අවසර ලබා දී ඇත.

02. නමුත් COPA කමිටුව 2023.12.31 දින වන විට සියලු බැංකු මැනුවල් ක්‍රියාවලිය අවසන් කරන බවට ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ඉදිරිපත් කරන ලදි. එම සැලැස්මට අනුව ඉලක්කය ලඟාකර ගැනීමට අපහසු වීම මත මෙම ක්‍රියාවලිය වේගවත් කරන ලෙස 2024.01.10 දින පැවැති COPA කමිටුවේදී උපදෙස් දෙන ලදි.

03. 2023.11.18 දිනැති හා 2023.10.18 දිනැති ලිපි මගින් පහත පරිදි දිස්ත්‍රික් පරික්ෂණ කමිටුවක් පත් කිරීමට උපදෙස් දී ඇත.
ඒ අනුව මීට පෙර ඔබ වෙත ලබාදුන් උපදෙස් අනුව,

I. A+ තොරතුරු තාක්ෂණ නිලධාරි
II. අභ්‍යන්තර විගණන නිලධාරි (නිරීක්ෂකයෙකු ලෙස)
III. බැංකු අධීක්ෂණ නිලධාරි

04. තවදුරටත් මැනුවල් ක්‍රියාවලිය ඉවත් කිරීම සඳහා බැංකු රැසක් ඇත්නම් ඉහත පරිදි කමිටු කීපයක් පිහිටුවා මෙම ක්‍රියාවලිය වේගවත් කල යුතුය.

05. දිස්ත්‍රික්කය තුල පිහිටුවන කමිටු සාමාජිකයන්ගේ නම් සමඟ ඒ ඒ කමිටුවට ලබා දී ඇති බැංකු හා අදාල බැංකුව පරික්ෂා කරන දිනය ඇතුලත් වාර්තාවක් සකස් කර 2024.02.05 දිනට පෙර තොරතුරු තාක්ෂණ අංශය samuit2019@gmail.com යන ඊ-මේල් ලිපිනයට යොමු කරන්න. මීට අමතරව පිටපතක්

බැංකු මූල්‍ය අංශයේ microfinanceall2021@gmail.com යන ඊ-මේල් ලිපිනයට යොමු කරන මෙන් දන්වා සිටිමි.

සී.ඩී. කළුආරච්චි

අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්**

1. ප්‍රධාන අභ්‍යන්තර විගණක (අභ්‍යන්තර විගණන අංශය) - කා.දැ.පි
2. අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) - කා.දැ.පි